FREE LAWYERS
153/20 Nawala Road, Colombo 5

**කොළඹ 7, මල් පාර ඒකාබද්ද විපක්ෂයේ ප්‍රවෘත්ති සාකච්ඡාවේ දී හිටපු ආණ්ඩුකාරවර රජිත් කීර්ති තෙන්නකෝන් මහතා දැක්වූ අදහස**

යම් නීතියක් සකස් කිරීමේ දී එයට අදාළ සියළු පාර්ශවයන් සමඟ සාකච්ඡා කර ප්‍රශස්ත අන්දමින් කටයුතු කිරීමේ ව්‍යවහාරයක් පැවතිය යුතුයි. නමුත්, නීති සම්පාදනයේ දී ලංකාවේ ක්‍රියාත්මක වන සියළුම ව්‍යවහාරයන් පැත්තකට දාලා, තනිකරම ඒකාධිපති - උද්ධච්ච 'නීති සම්පාදන ව්‍යවහාරයක්' බවට පත්වෙමින් තියෙනවා.
ආණ්ඩුව මේ ඒකාධිපති - උද්ධච්ච ප්‍රවේශය ලබාගෙන තියෙන්නේ රටේ ආර්ථිකය දවසින් දවස විනාශ මුඛයට යමින් ජනතාවගේ ආර්ථිකයට බලපෑම් කරන නිසයි.

### උද්ධමනය ඉහළ යාම

2026 පෙබරවාරි (1.6%) ක් වු උද්ධමනය ජූලි මස වන විට 7.3% දක්වා 5.7% කින් වැඩිවෙලා.

### වෙළඳ හිඟය පුළුල්වීම

වසරේ පළමු මාස 6 තුල වෙළඳ හිඟය ඩො.බි. 5.5 ක් ලෙස වර්ධනය වෙලා.

### අය වැය අතිරික්තය අහසින් පොළවටම

මැයි මාසය අවසානයේ අය වැය අතිරික්තය රු.බි. 197.3 ක් වුනා. 2026 ජූනි අවසානය වන විට අය වැය අතිරික්තය රු.බි. 9.5 දක්වා අඩුවෙලා තියෙනවා.

### විදේශ සංචිත පහත වැටීම

2025 මාර්තු මස ඩො. මි. 6,531 ක් වූ විදේශ සංචිත 2026 ජුලි අග වන විට ඩො.මි. 6,519 දක්වා පහත වැටී තිබේ.

### ණය බර වැඩිවීම

2024 නොවැම්බර් මස රු.බිලියන 28,240.22 ක් වූ මධ්‍යම රජයේ නොපියවූ ණය ප්‍රමාණය, 2026 මාර්තු වන විට රු. බිලියන 30,193.18 දක්වා රු. බිලියන 1,952.96 කින් වැඩි වෙලා තියෙනවා.

ආණ්ඩුවට මේ ප්‍රශ්නවලට උත්තරයක් නෑ. ඒ නිසා. ආණ්ඩුව විපක්ෂය, සිවිල් ක්‍රියාකාරීත්වය, බලපෑම් කණ්ඩායම්, විකල්ප අදහස් තියෙන උදවිය මර්ධනය කරන්නට කටයුතු කරනවා.

ආණ්ඩුව මේ සතියේ අලුත් නීති තුනක් පාර්ලිමේන්තුව ගෙනාවා.
22 ව්‍යවස්ථා සංශෝධනය සහ අධිකරණ සංවිධාන පනත, දූෂණ විරෝධී පනත සංශෝධනය කියන නිති තුනම පාර්ලිමේන්තුවේ කිසිම කමිටුවක සාකච්ඡා කරලා නෑ. ආණ්ඩුව පැත්තෙන් කිසිම සාකච්ඡාවක් සම්මන්ත්‍රණයක් තියලා නෑ. මේ විෂයයන් ගැන විශේෂඥ දැනුමක් තියෙන උගත් බුද්ධිමත් පිරිසක් එක්ක කතා කරලා නෑ. සිවිල් සංවිධාන එක්ක කතා කරලා නෑ.
මේ ව්‍යවහාරය තනිකරම 'ඒකාධිපති - උද්දච්ච' වැඩක්. තමන්ට හිතෙන හිතෙන දේ කරනවා. තමන්ට හිතෙන හිතෙන නීති සම්පාදනය කරනවා. තුනෙන් දෙකක් තියෙන නිසා ඒවා සම්මත කර ගන්න පුළුවන් කියලා හිතලා තනිකරම තනිකරම වියරු ඒකාධිපති ගමනක් යනවා.
අද නැවත වරක් පාර්ලිමේන්තුව කියන රටේ ව්‍යවස්ථාදායක බලය හිමි ආයතනය විධායක ජනාධිපතිවරයා ගේ ඩබල් පොකට් සාක්කුවට වැටිලා තියෙන්නේ. ඩබල් පොකට් කමිසයේ අනික් සාක්කුවට 'අධිකරණය' දමා ගැනීම තමයි මේ කරන්නේ.
22 ව්‍යවස්ථා සංශෝධනය, අධිකරණ සංවිධාන පනත සහ දූෂණ විරෝධී පනතේ සංශෝධන හරහා කරන්නේ අධිකරණය සාක්කුවට දමාගැනීම.

දූෂණ විරෝධී පනත කියන්නේ විශේෂ පනතක්. එය ඇප පනතේ විධි විධානවලින් සම්පූර්ණයෙන්ම ඉවත් කරන්න එක තමයි මේ සංශෝධනයෙන් කරන්නේ. විපක්ෂයේ ඉන්න තෝරාගත් පුද්ගලයින්ට ඇප නැති කරනවා. දේශපාලනය කරන්න බැරි කරනවා. මේකෙන් වෙන්නේ හිර ගෙවල් තවත් පිරවෙන එක. තව තව අර්බුදය ඇති වෙලා, මිනිස්සු මරලා දාන එක. හිරගෙවල් ගිණි ගන්න එක.

මල් පැල පාර්ලිමේන්තුව -- ව්‍යවස්ථාදායකය අනික් සාක්කුවේ තියෙන නිසා එතුමා හිතනවා පපුව ඉස්සරහට දාලා ඒකාධිපති ගමනක් යන්න.
කණගාටුවෙන් වුවත් කියන්න ඕනි, අද පාර්ලිමේන්තුව තුල විපක්ෂය දවසින් දවස හැකිලෙනවා. ආණ්ඩු පක්ෂය කියන්නේ විධායකයේ අවශ්‍යතාවය මත නැටවෙන රූකඩ ටිකක් විතරයි. ඔවුන්ගේ කතා නෙවෙයි, හැසිරීම බලන්න. බොරු විදින, තනිකරම උද්දච්ච හැසිරීමක් තියෙන්නේ.
මේ සතියේ ගෙනාපු ව්‍යවස්ථා සංශෝධනය හා පනත් සංශෝධන වලින් කරන්න හදන්නේ තමන්ට හිතවත් නඩු තීන්දු දෙන්න විශ්‍රාම යා යුතු පුද්ගලයින් ටිකක් ඉතුරු කර ගන්න බලනවා.
ව්‍යවස්ථා සංශෝධනයේ බොහෝ දෙනා කතා නොකළ දෙයක් තමයි පළාත් මට්ටමින් අභියාචනාධිකරණ පිහිටුවීම. අභියාචනාධිකරණයක් බොහෝ විට රටේ පවතින නීතිය අර්ථ ගන්වලා ව්‍යවහාරයෙන් නව නීති සකස් කරනවා. මේක පළාත් මට්ටමින් සිදු කරන්න ගියාම, එක එක පලාතට වෙනස් වෙනත් තීන්දු එන්න පුළුවන්. උදාහරණයක් විදිහට යාපනයේ පිහිටුවන අභියාචනාධිකරණයේ තීරණය මධ්‍යම හෝ ඌව පළාතේ තීරණයට පරස්පර වෙන්න පුළුවන්.
අඩුම ගානේ මෙවැනි සංකීර්ණ තාක්ෂණික කාරනා ගැන වත් සාකච්ඡාවක් කරන්නේ නැතුව තමයි මේ පනත් පාර්ලිමේන්තුවට ගෙන්නේ.
මේවා ගැන සාකච්ඡා නොකර හදන නීති අනාගතයේ දවසක මුළු රටම අවුල් ජාලයක් කරන්න පුළුවන්.

මේ තත්වය ඉදිරියේ දී අනෙකුත් සියළුම නීති පනත් සංශෝධන සඳහා ක්‍රියාත්මක වෙන්නට පුළුවන්.
මාධ්‍ය පාලනය සඳහා අවශ්‍ය නීති කෙටුම්පතක් මේ වන විටත් ඉදිරිපත් කර තිබෙනවා. අද මාධ්‍ය ක්ෂේත්‍රයේ කටයුතු කරන බහුතරයකට ඒ පනත ආවොත් මාධ්‍ය ක්ෂේත්‍රයේ අද කරන රැකියාව අහිමි කරන්න පුළුවන්.
රාජ්‍ය නොවන සංවිධාන පනත් කෙටුම්පත හරහා ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති 'සංගමයේ නිදහස -- right to associate නැත්තටම නැති කරන්න හදනවා.
ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත අහෝසි කරනවා කියලා බලයට ඇවිත් දැන් ඊටත් වඩා දුෂ්ඨ පනතක් ගේන්න හදනවා. එකෙන් කරන්න හදන්නේ තමන්ට විරුද්ධ සියළු දෙනා හිර ගෙදරට දැක්කවීම. මර්ධනය කිරීම.
ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **9 වන වගන්තිය** මගින් බුදු දහමට ප්‍රමුඛස්ථානය ලබා දී ම අද වන විට කුණු කූඩයට දාලා තියෙනවා. අති උතුම් මහ නායක හිමිවරුන් හතර දෙනො ජනාධිපතිවරයාට යොමු කළ ලිපියකට උත්තරයක් යවන්නේ නැති තත්වයකට පත් වෙලා තියෙනවා.
භික්ෂු සමාජයට අද ඇතිකරලා තියෙන පීඩනය විතරක් නෙවෙයි, සත්ව හිංසන පනත නිසා පෙරහැර පැවැත්වීම පවා අද අභියෝගයට ලක් කරලා තියෙනවා.

සමාජයේ සෑම ස්ථරයක්ම බියෙන් තැති ගන්වලා, මර්ධනය කරලා, තනිකරම ඒකාධිපති ගමනක් මේ යන්න හදන්නේ. මේ ගමන වැලැක්වීම සඳහා සියළුම දේශපාලන පක්ෂ එක් විය යුතුයි.

රජිත් කීර්ති තෙන්නකෝන්
2026 අගෝස්තු 20